# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | |
|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | දුරකථන<br>தொலைபேசி<br>Telephone<br>+94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax<br>+94 11 2484970<br>+94 11 2320042 | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website<br>www.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No.<br>TO/CFM/01/05/04 | ඔබේ අංකය<br>உமது இல<br>Your Number | දිනය<br>திகதி<br>Date<br>2021.11. 25 |

**හාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක - 04/2020**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>2022 වර්ෂය සඳහා වන විසර්ජන පනත යටතේ සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව කෙරෙන ගෙවීම් වෙනුවෙන් එක් එක් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වෙත වාර්ෂික අග්‍රිම සීමාවන් නියම කිරීම සඳහා තොරතුරු කැඳවීම</u>**

01. 2020.10.14 දිනැතිව නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 04 හි සඳහන් උපදෙස් පරිදි 2022 වර්ෂයට අදාල වාර්ෂික අග්‍රිම සීමාව නියම කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු යටතේ ඔබ වෙත සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන පදනම් කරගෙන මු.රෙ.367(අ) අනුව ඇස්තමේන්තුවක් , මේ සමඟ අමුණා ඇති TOD/IMP/1,TOD/IMP/2, TOD/IMP/3 සහ TOD/IMP/9 යන ආකෘතිපත්‍ර ප්‍රකාරව සකස් කර අදාල අනෙකුත් විස්තරද සමඟ 2021.12.17 දින හෝ එදිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

02. මෙතෙක් රාජ්‍ය ආයතනවලට වියදම් කිරීමට මුළු මූල්‍ය වර්ෂය සඳහා දෙනු ලබන විවෘත අධිකාරී බලය (Annual Warrant) 2022 වර්ෂයේ සිට ඉදිරියට කාර්තුවෙන් කාර්තුවට ( Quarterly Warrant) නිකුත් කිරීමට 2022 අයවැය කථාව තුලින් මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා කර ඇති බැවින් අංක TOD/IMP/02 දරණ ආකෘතිය මඟින් දක්වන විස්තර ඉතාමත් නිවැරදිතාවයකින් යුක්තව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි. තවද මේ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව / ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උපදෙස්ද සලකා බැලීමෙන් අනතුරුව තොරතුරු ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

03. භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 04 හි සඳහන් අනෙකුත් විධි විධාන හා උපදෙස් තවදුරටත් එසේම නොවෙනස්ව පවතී.

එච්.සී.ඩී.එල්. සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්